)පීඨීම් ඇවීලු!දි ට්වරිමීපී
*All Rights Reserved*

# අවසාන වාර පරීක්ෂණය 2015

6 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''මැනලත් නැලි දෙකක් දුනි වී අම්මාට
වෙනදත් ඔහොම දෙනවා අවුරුද්දකට
කවදත් ඔහොමමයි උන්දෑගේ සටකපට
උඹ සිත් කෝප නොම ගෙන පලයන්කො ගෙට''
යන කවි ගායනයට අයත් වන්නේ,

(1) සිරිත්මල්දම් කවියකි. (2) ජනකථාවකින් උපුටා ගත්තකි.
(3) ලෝවැඩ සඟරාවෙන් උපුටා ගත්තකි. (4) ජාතක කථාවකින් උපුටා ගත්තකි.

02 ''නාඩි බැලීම'' නම් ජනකථාව අයත් රචකයා වන්නේ,

(1) නෝමන් සිරිපාල ය. (2) පාලිත ලොකුපෝතානගමගේ ය.
(3) එස්. විජේසූරිය ය. (4) චන්ද්‍රසේන දසනායක ය.

03 නාට්‍යයක් යනු,

(1) යමක් කර පෙන්වීමකි.
(2) අසා රසවිඳිය හැක්කකි.
(3) නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන එනු ලබන මාධ්‍යයයි.
(4) හොඳ තිර නාටකයකි.

04 නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන එනු ලබන්නේ,

(1) සතර අභිනය මගිනි. (2) සංවාද මගිනි.
(3) අනුකරණය මගිනි. (4) අභිරූපණය මගිනි.

05 සාත්වික අභිනය ලෙස හඳුන්වන්නේ,

(1) ශරීරයේ ඇඟ පසඟ මගින් නිරූපණයයි.
(2) සංවාද මගින් අදහස් නිරූපණයයි.
(3) මුහුණ ප්‍රමුඛ කොටගත් නිරූපණයයි.
(4) වේදිකාවට පිටතින් ගෙන එන ලද අනුශාංගික අංග සමග නිරූපණයයි.

06 ''සමාරෝපය'' යන්නෙහි අර්ථය වන්නේ,

(1) චරිතයක් අනුකරණයයි. (2) චරිතයක් ඉදිරිපත් කිරිමයි.
(3) චරිතයකට සංවාද භාවිතයයි. (4) චරිතයකට ප්‍රවිශ්ට වීමයි.

07 ''භූමිකාව' ලෙස හඳුන්වන්නේ,

(1) චරිතයන් ය. (2) රූපණය ය. (3) සමාරෝපය යි. (4) අනුකරණය යි.

08 ක්ෂණික නිරූපණයේ දී

(1) සංවාද භාවිතා නොකරයි.
(2) විශාල කාලයක් ලබාදෙයි.
(3) පරිකල්පන ශක්තිය හා අනුකරණාත්මක ක්‍රියාවලියකි.
(4) අභිරූපණයකට සම්බන්ධයි.

The National e-learning Portal for the General Education

09 වේදිකා නාට්‍යයක් සඳහා රංග භාණ්ඩ නිර්මාණයේ දී

(1) ප්‍රමාණයෙන් කුඩා විය යුතුයි. (2) වර්ණවත් විය යුතුයි.

(3) පහසුවෙන් පැළඳීමට, ඉවත් කිරීමට හැකි විය යුතුයි. (4) කල්පැවතිය යුතුයි.

10 'වෙල්ල වැහුං'' නාට්‍ය නිර්මාණයේ නිෂ්පාදකයා වන්නේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍රයන් ය. (2) දයානන්ද ගුණවර්ධනයන් ය.

(3) ලූෂන් බුලත්සිංහල ය. (4) සෝමලතා සුභසිංහ ය.

11 ජන ක්‍රීඩාවලට අයත් නොවන්නේ මින් කවරේ ද?

(1) පනා හැංගීම (2) ලේන්සු හැංගිම (3) මේවර කෙළිය (4) චලන අභ්‍යාස

12 තමන් පණ ලෙස හැම සතුන් ගැන සලකා පෙම

ඔවුන් දුටු විලසම කරන් ආදර ගුණය නොහැරම

මෙම කවිය අයත්වන්නේ,

(1) ජන කථාවකට ය. (2) සිරිත් මල්දමට ය.

(3) ලෝවැඩ සඟරාවට ය. (4) ළමා නාට්‍යයකට ය.

13 ''පාලිත ලොකුපෝතා ගමගේ'' නාට්‍ය නිර්මාණයකි.

(1) අමර ගියා දිව්‍ය ලෝකේ (2) පුංචි අපට දූන් තේරෙයි

(3) නරි බෑණා (4) මූදු පුත්තු

14 චරිතයක් සඳහා සුදුස්සන් තේරීම ලෙස හඳුන්වන්නේ,

(1) අධ්‍යක්ෂකගේ කාර්යයි. (2) අනුශාංගික ශිල්පීන් වරණයයි.

(3) වේදිකා පාලකගේ කාර්යයයි. (4) නළු නිළි වරණයයි.

15 ''රංග අභ්‍යාස'' වලට අයත් වන්නේ,

(1) ශිථිලකරණ අභ්‍යාස (2) මේවර කෙළිය

(3) පොර පොල් ගැසීම (4) චක්ගුඩු පැනීම

- අංක 156 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

16 අභිනයේ ප්‍රභේද හතරකි. ( )

17 රූපණයේ දී නළුවෙකු විසින් චරිත ස්වභාවය අධ්‍යයනය කළ යුතුය. ( )

18 නාට්‍යයක නළු නිළියන් පුහුණු කරවන්නා පොතේගුරා ය. ( )

19 ''රංග විධාන'' යනු නාට්‍ය සංවිධානය කිරීමයි. ( )

20 ''නාට්‍යෝපකරණ'' ආහාර්ය අභිනයට අයත්ය. ( )

(1 x 20 = 20)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**

01 (1) සරල කතාන්දරයක් තෝරාගෙන එයින් සරල නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

(2) කතාන්දරයක් හා නාට්‍යයක් අතර ඇති වෙනස්කම් 5 ක් ලියන්න. (ල. 10)

02 (1) ''අභිනය' යනු කුමක් ද?

(2) සතර අභිනය නම්කොට විස්තර කරන්න. (ල. 10)

03 (1) රංග අභ්‍යාස 3 ක් නම් කරන්න.

(2) රංග අභ්‍යාස මගින් නළුවාට අත්වන ප්‍රයෝජන 5 ක් ලියන්න. (ල. 10)

04 ඔබ සිඟන්නෙකු හෝ මාළු වෙළඳාම් කරන්නෙකුගේ චරිත නිරූපණයේ යෙදෙනවා යැයි සිතන්න.

(1) එම චරිතවලට අදාළ නාට්‍යෝපකරණ දෙක බැගින් නම් කරන්න.

(2) එම චරිතවලට අදාළ නාට්‍යෝපකරණ රූප සටහන් මගින් ඇඳ දක්වන්න. (ල. 10)